# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,705—1959 මාර්තු 20 වැනි සිකුරාදා—20.3.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# II වැනි කොටස—අධිකරණ

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබාගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් ... ... ... | — |
| ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | 125 | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | 125 | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| වස්තුභංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... — | — |


## ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශ පත්‍රයයි

ශ්‍රී ලංකාවීපයේ ගරු කටයුතු උතුම් වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙසින් ප්‍රකාශ කරන්නේ නම් යාපනය, මන්නාරම වව්නියා-මුල්ලතිව් දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්‍ෂ 1959 ක්වූ මාර්තු මස 30 වෙනි දින පෙරවරු 11 පැය පටන් යාපනය නගර ශාලාවේ තිබෙන නඩුශාලාවේ පවත්වන්නට යෙදෙනවා ඇත.—එහි යම් කාරණා ඇතුව සිටින සෑමදෙනාම යට කී සෘානයට යට කී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙසින් සෑම දෙනාටම දන්වන්නෙමි.

එම්. ශ්‍රීකාන්තා,
උතුරු පළාත පිස්කල් වමහ.

වර්‍ෂ 1959 ක්වූ මාර්තු මස 16 දින,
යාපනය පිස්කල් කන්තෝරුවේදීය.

## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

### කණ්ඩුල්ල මහෙස්ත්‍රාත් උසාවිය

1930 අංක 24 දරණ ආඥාපනතෙන් සංශෝධිත, 1894 අංක 12 දරන ආඥාපනතේ 6 වෙනි වගන්තියේ ප්‍රකාර මෙම උසාවියේ තිබෙන වටිනාකමක් නැති මෙහි පහත සඳහන් පැරණි නඩුපොත් මෙතැන් සිට තුන් මාසයක් ගියතැන විනාශකර දමන බව මෙසින් දැනුම් දෙමි.

යම්කිසිවෙකුට යම් නඩුපොතක් ගැන අවශ්‍යතාවයක් තිබේනම් එකී නඩුපොත විනාශ නොකිරීමට ඇති හේතු හොඳාකාර ඉදිරිපත් කර තමා විසින් පුද්ගලිකව හෝ නීතිඥයකු මාර්ගයෙන් හෝ නිසියාකාර පිළියෙල කළ පෙත්සමක මාර්ගයෙන් ඉල්ලුම් කළ යුතුයි.

| නඩු | | දින | |
|---|---|---|---|
| නො. සිට | නො. දක්වා | සිට | දක්වා |
| 19100 | 20660 | 7. 5. 1936 | 27. 11. 1936 |
| 1 | 26635 | 27. 11. 1936 | 31. 5. 1948 |

ජේ. ස. කුලතිලක,
මහෙස්ත්‍රාත් තැන.

මහෙස්ත්‍රාත් උසාවිය,
කණ්ඩුල්ල, කුලියපිටිය,
9, මාර්තු, 1959.

## විශේෂ නිවේදනයයි

1959 මාර්තු 27 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 මාර්තු මාසයේ හතරවැනි සුමානයේ ගැසට් පත්‍රය, 1959 මාර්තු 26 වැනි බ්‍රහස්පතින්දා නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 මාර්තු 23 වැනි සඳුදා පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 10 වැනි දින,
කොළඹ
ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී